ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

## <u>ප්‍රථම ඉන්දියා - ශ්‍රී ලංකා ආරක්ෂක සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය සාර්ථකව අවසන් වේ</u>

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කළ ආරක්ෂක කර්මාන්තය පිළිබඳ ප්‍රථම සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය 2023 ජූනි 7 වන දින කොළඹ දී පැවැත්විණ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා මෙම වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, ආරක්ෂක ලේකම්තුමා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිතුමා, ශ්‍රී ලංකා නාවික හමුදාපතිතුමා සහ ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරිහු ද මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙයට අමතරව, හින්දුස්ථාන් එරෝනොටික්ස් ලිමිටඩ්, ගෝආ ෂිප්යාඩ් ලිමිටඩ් සහ භාරත් ඉලෙක්ට්‍රොනික්ස් ලිමිටඩ් වැනි ප්‍රමුඛ පෙළේ ඉන්දියානු ආරක්ෂක සමාගම් 16ක පමණ නියෝජිතයෝ ද මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ දේශීය ආරක්ෂක කර්මාන්තයේ නියෝජිතයන් රැසක් ද මහත් උනන්දුවකින් මේ සඳහා සහභාගී වූහ.

2. දෙරටෙහි ආරක්ෂක ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් එකට එක් කරමින් පැවති ප්‍රථම වරට පැවති මෙම ප්‍රදර්ශනය සම්බන්ධයෙන් මහ කොමසාරිස්තුමා සිය ප්‍රශංසාව පළ කළේය. ඉන්දියාව රටවල් 85කට අපනයනය කරන බව ද 2022 අප්‍රේල් සිට 2023 මාර්තු දක්වා ආරක්ෂක අපනයන ඇමරිකානු ඩොලර් බිලියන 2ක් ලෙස වාර්තා වූ බව ද එතුමා අවධාරණය කළේය. මෙම වැඩසටහන කලාපයේ සහකාර රටවල් සමඟ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට ඉන්දියාවේ කැපවීම හා ඉන්දීය රජයේ "වාසුධායිව කුටුම්භකම්" එනම් ලොවම එක් පවුලක් යන සංකල්පය හා සමපාත වන බව පෙන්වා දුන්නේය. එසේම, මෙම වැඩසටහන ඉන්දියාවේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය සඳහා ප්‍රායෝගික නිදසුනකි.

3. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා ඉන්දීය ආරක්ෂක කර්මාන්තයේ වර්ධනය අගය කළ අතර මෙම සම්මන්ත්‍රණය දෙරට අතර සහයෝගීතාවය ඉහළ නැංවීමට ද එමගින් ස්ථාවර ඉන්දීය සාගර කලාපයක් ඇති කිරීම සඳහා ද ඉවහල් වනු ඇතැයි විශ්වාසය පළ කළේය. පසුගිය දශකය තුළ ඉන්දියාවෙන් පිරිවැය අවම සහ අවශ්‍යතාවය පරිදි නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන ලබා ගැනීම ශ්‍රී ලංකාවේ සෛවරීත්වය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරගැනීම උදෙසා උපකාර වී ඇත. ඉන්දීය ආරක්ෂක කර්මාන්ත සමඟ සහයෝගීතාවය සහ ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනයට ද මඟ පාදනු ඇති බව රාජ්‍ය අමාත්‍යතුමා අවධාරණය කළේය. අභියෝගාත්මක කාලසීමාවන් හිදි ශ්‍රී ලංකාව සමඟ රැඳී සිටීම වෙනුවෙන් එතුමා ඉන්දියාවට සිය ස්තුතිය පළ කළේය.

4. පැමිණ සිටි පිරිස වීඩියෝ පණිවිඩයකින් අමතමින්, ඉන්දියාවේ ආරක්ෂක ලේකම් ශ්‍රී ගිරිධර් අරමනේ මහතා ශ්‍රී ලංකාව ඉන්දියාවේ ප්‍රමුඛතා සහකරු වන බව සඳහන් කළ අතර ඉන්දියාව අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ SAGAR (කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය) යන දැක්මෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා සහ හැකියා ගොඩනැගීමට කැප වී සිටින බව සහතික කළේය. ඉන්දියානු සාගර කලාපය තුළ මුහුණ දෙන පොදු අභියෝග ද අවධාරණය කළ එතුමා වඩා ආරක්ෂාකාරී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සහයෝගීතාවය ඉහළ නැංවිය යුතු බව ද ප්‍රකාශ කළේය. ඉන්දියාව "ආත්මනිර්භාර් භාරත්" වැඩසටහන යටතේ නව්‍යකරණය සහ ව්‍යවසායකත්වය දිරිගන්වමින් වේගවත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ දේශීය නිෂ්පාදන පරිසර පද්ධතීන් ස්ථාපනය කිරීම උදෙසා සුවිසල් පරිවර්තනයක් අබිමුව සිටින බව ද එතුමා සඳහන් කළේය.

5. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව L 70 තුවක්කු, ඉන්ද්‍රා රේඩාර්, උසස් ගැඹුරු මුහුද නිරීක්ෂණ යාත්‍රා සහ හමුදා පුහුණු සිමියුලේටර් වැනි පුළුල් පරාසයක ඉන්දියානු ආරක්ෂක උපකරණ සාර්ථකව මෙහෙයවයි. මෑත කාලයේ දී ඉන්දීය රජය පාවෙන තටාකය, සමුද්‍රීය මුදවාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ ඩෝනියර් ගුවන් යානා සැපයීමට ද එකඟ වී ඇති අතර මෙම පියවර ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා ගොඩනැගීම තහවුරු කරයි. ඉදිරිපත් කිරීම්, සජීවී පැහැදිලි කිරීම් සහ ඉන්දියා - ශ්‍රී ලංකා ව්‍යාපාර නියෝජිතයන් සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් සහ පොලිසිය අතර

අන්තර්ක්‍රියා ඇතුළත් වූ මෙම විචිත්‍රවත් සම්මන්ත්‍රණය ආරක්ෂක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ධනාත්මක සාකච්ඡාවක් සහ නියැළීමක් නිර්මාණය කිරීමට සමත් විය. මෙම ප්‍රදර්ශනය මහජනතාව සඳහා ද විවෘතව පැවති අතර ආරක්ෂක ක්ෂේත්‍රයේ නිරතවන්නන්, බාල දක්ෂිකාවන් සහ බාල දක්ෂයන්, NCC කැඩෙට් නිලධාරීන් ඇතුළු උනන්දුවක් දක්වන විශාල පිරිසක් ප්‍රදර්ශනය නැරඹීමට එක් වූහ.

***

කොළඹ
2023 ජූනි 9